

# බුදුසරණ

## පෝය ලබන ගෙවෙන වේලා සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | |
|---|---|---|---|---|
| **දුරුතු පෝය–** | | | | |
| ජන 04 | ඉරිදා | පූ.භා 05.39 න් පුර අටවක ලබා 05 සඳුද පූ.භා. 05.03 න් ගෙවේ. | 04 ඉරිද | සිල් |
| **ජන 10** | **සෙනසු** | **අ.භා. 12.39 න් පසළොස්වක ලබා 11 ඉරිද පූ.භා. 08.59 න් ගෙවේ.** | **10 සෙනසු** | **සිල්** |
| ජන 17 | සෙනසු | අ.භා. 07.57 න් අව අටවක ලබා 18 ඉරිද අ.භා. 08.57 න් ගෙවේ. | 18 ඉරිද | සිල් |
| ජන 25 | ඉරිද | පූ.භා. 11.09 න් අමාවක ලබා 26 සඳුද අ.භා 01.24 න් ගෙවේ. | 25 ඉරිද | සිල් |
| **නවම් පෝය–** | | | | |
| පෙබ 02 | සඳුද | අ.භා. 05.20 න් පුර අටවක ලබා 03 අඟ අ.භා. 03.51 න් ගෙවේ. | 02 සඳුද | සිල් |
| **පෙබ 08** | **ඉරිද** | **අ.භා. 11.23 න් පසළොස්වක ලබා 09 සඳුද අ.භා. 08.23 න් ගෙවේ.** | **09 සඳුද** | **සිල්** |
| පබ 16 | සඳු | අ.භා. 02.18 න් අව අටවක ලබා 17 අඟ අ.භා. 04.14 න් ගෙවේ. | 16 සඳුද | සිල් |
| පෙබ 24 | අඟහ | පූ.භා. 06.01 න් අමාවක ලබා 25 බදද පූ.භා. 07.05 න් ගෙවේ. | 24 අඟහ | සිල් |
| **මැදින් පෝය–** | | | | |
| මාර්තු 04 | බදද | පූ.භා. 02.13 න් පුර අටවක ලබා 05 බ්‍රහස්. පූ.භා. 00.15 න් ගෙවේ. | 04 බදද | සිල් |
| **මාර්තු 10** | **අඟහ** | **පූ.භා. 10.11 න් පසළොස්වක ලබා 11 බදද පූ.භා. 08.10 ගෙවේ.** | **10 අඟහ** | **සිල්** |
| මාර්තු 18 | බදද | පූ.භා. 10.05 න් අව අටවක ලබා 19 බ්‍රහස්. අ.භා. 12.36 න් ගෙවේ. | 18 බදද | සිල් |
| මාර්තු 25 | බදද | අ.භා. 10.02 න් අමාවක ලබා 26 බ්‍රහස්. අ.භා. 09.33 න් ගෙවේ. | 26 බ්‍රහස් | සිල් |
| **බක් පෝය–** | | | | |
| අප්‍රේල් 02 | බ්‍රහස් | පූ.භා. 09.07 න් පුර අටවක ලබා 03 සිකු පූ.භා. 07.03 න් ගෙවේ. | 02 බ්‍රහස් | සිල් |
| **අප්‍රේල් 08** | **බදද** | **අ.භා. 09.14 න් පසළොස්වක ලබා 09 බ්‍රහස්. අ.භා.08.30 න් ගෙවේ.** | **09 බ්‍රහස්** | **සිල්** |
| අප්‍රේල් 17 | සිකුරා | පූ.භා. 05.51 න් අව අටවක ලබා 18 සෙන. පූ.භා. 08.20 න් ගෙවේ. | 17 සිකුරා | සිල් |
| අප්‍රේල් 24 | සිකුරා | පූ.භා. 10.48 න් අමාවක ලබා 25 සෙන. පූ.භා. 08.52 න් ගෙවේ. | 24 සිකුරා | සිල් |
| **වෙසක් පෝය–** | | | | |
| මැයි 01 | සිකුරා | අ.භා. 03.16 න් පුර අටවක ලබා 02 සෙන. අ.භා. 01.24 න් ගෙවේ. | 01 සිකුරා | සිල් |
| **මැයි 08** | **සිකුරා** | **පූ.භා. 08.58 න් පසළොස්වක ලබා 09 සෙන. පූ.භා. 09.34 න් ගෙවේ.** | **08 සිකුරා** | **සිල්** |
| මැයි 16 | සෙනසු | අභා. 11.56 න් අව අටවක ලබා 18 සඳු පූ.භා. 01.45 න් ගෙවේ. | 17 ඉරිද | සිල් |
| මැයි 23 | සෙනසු | අ.භා. 08.40 න් අමාවක ලබා 24 ඉරිද අ.භා. 05.40 න් ගෙවේ. | 24 ඉරිද | සිල් |
| **පොසොන් පෝය–** | | | | |
| මැයි 30 | සෙනසු | අ.භා. 09.43 න් පුර අටවක ලබා 31 ඉරිද අ.භා. 08.19 න් ගෙවේ. | 31 ඉරිද | සිල් |
| **ජූනි 06** | **සෙනසු** | **අ.භා. 09.58 න් පසළොස්වක ලබා 07 ඉරිද අ.භා. 11.45 න් ගෙවේ.** | **07 ඉරිද** | **සිල්** |
| ජූනි 15 | සඳුද | අ.භා. 03.12 න් අව අටවක ලබා 16 අඟ. අ.භා. 03.57 න් ගෙවේ. | 15 සඳුද | සිල් |
| ජූනි 22 | සඳුද | පූ.භා. 04.43 න් අමාවක ලබා 23 අඟ පූ.භා. 01.05 න් ගෙවේ. | 22 සඳුද | සිල් |
| **ඇසළ පෝය–** | | | | |
| ජූනි 29 | සඳුද | පූ.භා. 05.25 න් පුර අටවක ලබා 30 අඟ .පූ.භා. 04.45 න් ගෙවේ. | 29 සඳද | සිල් |
| **ජූලි 06** | **සඳුද** | **අ.භා. 12.25 න් පසළොස්වක ලබා 07 අඟ අ.භා. 02.53 න් ගෙවේ.** | **06 සඳුද** | **සිල්** |
| ජූලි 15 | බදද | පූ.භා. 03.27 න් අව අටවක ලබා 16 බ්‍රහස්.පූ.භා. 03.07 න් ගෙවේ. | 15 බදද | සිල් |
| ජූලි 21 | අඟහ | පූ.භා. 11.50 න් අමාවක ලබා 22 බදද පූ.භා. 08.06 න් ගෙවේ. | 21 අඟහ | සිල් |
| **නිකිණි පෝය–** | | | | |
| ජූලි 28 | අඟහ. | අ.භා. 03.34 න් පුර අටවක ලබා 29 බදද අ.භා. 03.49 න් ගෙවේ. | 28 අඟහ. | සිල් |
| **අගෝ .05** | **බදද** | **පූ.භා. 04.00 න් පසළොස්වක ලබා 06 බ්‍රහස්. පූ.භා. 06.26 න් ගෙවේ.** | **05 බදද** | **සිල්** |
| අගෝ 13 | බ්‍රහස් | අ.භා. 12.53 න් අව අටවක ලබා 14 සිකු. පූ.භා. 11.42 න් ගෙවේ. | 13 බ්‍රහස් | සිල් |
| අගෝ 19 | බදද | අ.භා. 07.00 න් අමාවක ලබා 20 බ්‍රහස්. අ.භා. 03.35 න් ගෙවේ. | 20 බ්‍රහස් | සිල් |
| **බිනර පෝය–** | | | | |
| අගෝ.27 | බ්‍රහස් | පූ.භා. 04.38 න් පුර අටවක ලබා 28 සිකු. පූ.භා 06.00 න් ගෙවේ. | 27 බ්‍රහස් | සිල් |
| **සැප්. 03** | **බ්‍රහස්** | **අ.භා. 07.54 න් පසළොස්වක ලබා 04 සිකු. අ.භා. 09.31 න් ගෙවේ.** | **04 සිකුරා** | **සිල්** |
| සැප්. 11 | සිකුරා | අ.භා. 08.33 න් අව අටවක ලබා 12 සෙන. අ.භා. 06.49 න් ගෙවේ. | 12 සෙනසු | සිල් |
| සැප් 18 | සිකුරා | පූ.භා. 02.59 න් අමාවක ලබා 19 සෙන. පූ.භා. 00.17 න් ගෙවේ. | 18 සිකුරා | සිල් |
| **වප් පෝය–** | | | | |
| සැප් 25 | සිකුරා | අ.භා. 09.18 න් පුර අටවක ලබා 26 සෙන. පූ.භා. 11.34 න් ගෙවේ. | 26 සෙනසු | සිල් |
| **ඔක්. 03** | **සෙනසු** | **පූ.භා. 11.21 න් පසළොස්වක ලබා 04 ඉරිද අ.භා. 11.38 න් ගෙවේ.** | **03 සෙනසු** | **සිල්** |
| ඔක් 11 | ඉරිද | පූ.භා. 03.25 න් අව අටවක ලබා 12 සඳුද පූ.භා. 01.26 න් ගෙවේ. | 11 ඉරිදා | සිල් |
| ඔක් 17 | සෙනසු | අ.භා. 12.41 න් අමාවක ලබා 18 ඉරිද පූ.භා. 11.07 න් ගෙවේ. | 17 සෙනසු | සිල් |
| **ඉල් පෝය–** | | | | |
| ඔක් 25 | ඉරිද | අ.භා. 04.54 න් පුර අටවක ලබා 26 සඳුද අ.භා. 07.32 න් ගෙවේ. | 25 ඉරිද | සිල් |
| **නොවැ. 02** | **සඳුද** | **පූ.භා. 01.52 න් පසළොස්වක ලබා 03 අඟ පූ.භා. 00.42 න් ගෙවේ.** | **02 සඳුද** | **සිල්** |
| නොවැ. 09 | සඳුද | පූ.භා. 10.27 න් අව අටවක ලබා 10 අඟ. පූ.භා. 08.30 න් ගෙවේ. | 09 සඳුද | සිල් |
| නොවැ. 16 | සඳුද | පූ.භා. 00.52 න් අමාවක ලබා 17 අඟ. පූ.භා. 00.47 න් ගෙවේ. | 16 සඳුද | සිල් |
| **උඳුවප් පෝය–** | | | | |
| නොවැ. 24 | අඟහ | අ.භා. 01.55 න් පුර අටවක ලබා 25 බදද අ.භා. 04.13 න් ගෙවේ. | 24 අඟහ | සිල් |
| **දෙසැ. 01** | **අඟහ** | **අ.භා. 03.21 න් පසළොස්වක ලබා 02 බදද අ.භා. 12.59 න් ගෙවේ.** | **01 අඟහ** | **සිල්** |
| දෙසැ. 08 | අඟහ | අ.භා. 06.40 න් අව අටවක ලබා 09 බදද අ.භා. 05.02 න් ගෙවේ. | 09 බදද | සිල් |
| දෙසැ. 15 | අඟහ | අ.භා. 04.10 න් අමාවක ලබා 16 බදද අ.භා. 05.36 න් ගෙවේ. | 15 අඟහ. | සිල් |
| **දුරුතු පෝය–** | | | | |
| දෙසැ. 24 | බ්‍රහස් | පූ.භා. 10.17 න් පුර අටවක ලබා 25 සිකු. අ.භා. 11.40 න් ගෙවේ. | 24 බ්‍රහස් | සිල් |
| **දෙසැ 31** | **බ්‍රහස්** | **පූ.භා. 04.00 න් පසළොස්වක ලබා 01 සිකු. පූ.භා. 00.42 න් ගෙවේ.** | **31 බ්‍රහස්** | **සිල්** |

ඇපා පඤ්චාංග ලිතෙනි.

### දෙළොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**දුරුතු පසළොස්වක පොහොය**

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සදහම් මගට හරවා ඔවුන් හැම අරි සඟ ගණබවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම්තැන්තේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරුදනව් පියසට ගුවන් ගැබින් පහළ ව සවනක් බුදු රැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

**නවම් පසළොස්වක පොහොය**

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසන වංශ කථාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදු වූයේද නවම් පුණු පොහෝ දිනකය.

**මැදින් පසළොස්වක පොහොය**

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමග රජගහනුවර සිට තමන් වහන්සේ ගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදකය.

**බක් පසළොස්වක පොහොය**

බුදුපියාණන් වහන්සේ ගේ මහා ගුණකඳ මනසට නංවන අසිරිමත් දිනයකි. බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින දෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කදින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනක දී ය.

**වෙසක් පසළොස්වක පොහොය**

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ලොව පහළවීම බුදුවීම නිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත් වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසි බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

**පොසොන් පසළොස්වක පොහොය**

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළදිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය සමග වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

### දෙළොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**ඇසළ පසළොස්වක පොහොය**

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොවට පළමු වරට දේශනා කළ දිනයයි, ඇසළ පෝද

**නිකිණි පසළොස්වක පොහොය**

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝ ද පොහොය කොට නිකිණි අව පෑළවිය ද පසු වස් එළඹීමයි, සසුන් පිළිවෙත වත්තේ

**බිනර පසළොස්වක පොහොය**

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටුකර ගන්නා කාලයකි. මෙහෙණි සසුනේ ආරම්භය සිදු විය.

**වප් පසළොස්වක පොහොය**

වස්සාන ඍතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

**ඉල් පසළොස්වක පොහොය**

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණ ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසු වස් පවාරණය කළ යුතු දිනයද, සැරියුත් මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීමද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදය.

**උඳුවප් පසළොස්වක පොහොය**

උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන. ලංකා මෙහෙණි සසුන ගැන , ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වුවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

**සිතුවම**
**සරත් නන්ද කුමාර**